# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## අධ්‍යාපනවේදී උපාධිය III වසර - පළමු සෙමෙස්තරය - 2017/2018

## SC 408 – පාසල් උපදේශනය

## පැය තුනයි (03)

**I කොටසේ ප්‍රශ්න සියල්ලටම ද II කොටසේ ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.**

---

## I - කොටස

1. 'මාර්ගෝපදේශනය' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
2. පාසෝනියන් ආකෘතිය යනු කුමක්ද?
3. උපදේශනයේ ප්‍රධාන ක්ෂේත්‍ර හතර නම් කරන්න.
4. "භීතිකා" යනු (Phobia) අර්ථ දක්වා, උදාහරණ 2 ක් ලියන්න.
5. 'සාන්දෘෂ්ටික උපදේශන න්‍යායට අනුව මිනිසා එකවර ලෝක තුනක ජීවත් වේ.' ඒවා නම් කරන්න.
6. ඇල්බට් එලිස් ඉදිරිපත් කළ ABC සූත්‍රය ලියා දක්වන්න.
7. මොරිල්. ඔටින් හා හර්ස්ට් විසින් ඉදිරිපත් කළ මැදිහත් වීමේ ක්‍රම දෙකක් දක්වන්න.
8. උපදේශන සැසියක, ප්‍රශ්නකරණය යොදා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 4ක් ලියා දක්වන්න.
9. උපදේශනයේදී "ලුහුඬුකරණය" වැදගත්වීමට හේතු දෙකක් ලියා දක්වන්න.
10. පාසල් උපදේශන මධ්‍යස්ථානයක් සකස් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියා දක්වන්න.

(ලකුණු 2x10 = 20)

## II - කොටස

1. I. උපදේශනය අර්ථ දක්වා උපදේශනය හා උපදෙස් දීම අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 10)

II. සාම්ප්‍රදායික සුවපත් කිරීමේ කලාවේ වාසි හා අවාසි විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 10)

2. I. පාසල් ශිෂ්‍යයාට මතු වී ඇති උපදේශන අවශ්‍යතා ඔබ උගත් උපදේශන ක්ෂේත්‍ර දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

II. වෘත්තීමය ගුරුවරයකු වශයෙන් උපදේශන සත්වාරිත්‍රධර්ම පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා උපයෝගි කරගත හැක්කේ කෙසේදැයි උදාහරණ 4 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

3. I. උපදේශන සේවාවේ ප්‍රගමනය උදෙසා ඇමරිකානු උපදේශන සේවාව මගින් ඉටු වූ මෙහෙවර දශක පහක් ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

II. උපදේශකරුවයා සතු පෞරුෂ ගුණාංග උපදේශන ක්‍රියාවලියේ සාර්ථකත්වයට වැදගත් වන ආකාරය නිදසුන් 5ක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

4. I. හේතුවාදී චිත්තවේගික න්‍යායට අනුව ABCDEF සූත්‍රය නම් කර ABC අතර සම්බන්ධතාවය උදාහරණයක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 10)

II. අපගාමී ශිෂ්‍ය චර්යාවක් නිරීක්ෂණය කර දත්ත සටහන් කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රම දෙකක් උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

5. I. මනෝ විශ්ලේෂණවාදී න්‍යායට අනුව ශිෂ්‍යයාට ගැටලුවක් ඇතිවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

II. කාර්ල් රොජර්ස් ගේ උපදේශන න්‍යායට අනුව "කොන්දේසි විරහිත ධනාත්මක සැලකිල්ල" සහ "සහකම්පනය" ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රායෝගිකව යොදා ගන්නා ආකාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

6. I. උපදේශනයේ "ප්‍රාරම්භක චර්යා" නම් කර, ඒවා උපදේශන ක්‍රියාවලියෙහි සාර්ථකත්වය සඳහා ඉවහල් කරගන්නේ කෙසේද? යන්න උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

II. උපදේශකවරයකු විසින් ප්‍රගුණ කළ යුතු කුසලතාවයක් වශයෙන් "සහකම්පනය" යන්න අර්ථ දක්වා, සහකම්පනය ලබාදිය හැකි ප්‍රධාන ආකාර උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

○○○○○○○○○○○○○○